JOURNAL OF MULTIDISCIPLINARY & TRANSLATIONAL RESEARCH

**Journal of Multidisciplinary and Translational Research (JMTR)**

journal homepage: https://journals.kln.ac.lk/jmtr/



# සිංහල අක්ෂර හැඩතල කෙරෙහි පුරාණ ලේඛන අමුද්‍රව්‍යයන්ගේ බලපෑම

කිත්මි පෙරේරා[1]*

*[1]සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*

## සාරසංක්ෂේපය

විවිධ රටවලට අයත් ලේඛනයන්ගේ ස්වභාවය, ඔවුනොවුන්ට ආවේණික වූ ලේඛන විධීන් පවතින බවට සාක්ෂ්‍ය සපයයි. ඇතැම් විට එක ම භූගෝලීය කලාපයක වුව ද කාලීන සමාජ පරිස්ථිතිය අනුව හා අවස්ථෝචිත ව ලේඛනයේ ස්වරූපය වෙනස් වෙයි. ලේඛන අමුද්‍රවය යනු ලේඛනයේ ස්වභාවය අධ්‍යයනය කළ හැකි ද්‍රව්‍යමය සාධකය යි. මෙරට ලේඛනාරම්භයේ සිට ම ලිවීම සඳහා විවිධ අමුද්‍රව්‍ය භාවිත කොට තිබේ. ඒ අතර පැවැත්මෙන් හීන ලේඛන අමුද්‍රව්‍ය සේ ම කලක් පවතින ස්ථිර ගුණයෙන් යුත් ලේඛන අමුද්‍රව්‍ය ද දක්නට හැකි විය. දැනට ලාංකිකයන් භාවිත කොට ඇති ප්‍රධාන ලේඛන අමුද්‍රව්‍ය ලෙස සැලකෙන්නේ ලිවීම සඳහා මතුපිටක් ලෙස යොදාගත් මැටි, සෙල්, රන්පත්, තඹපත්, තලකොළ හා රෙදි කැබලි යනාදිය යි. ඒ මත ලිවීම උදෙසා ලී පතුරු හෝ ඊට සමාන යමක්, ගල් කටුව, තෙල්ල (පාලි ඃතුලිකා) සමඟ තීන්ත වෙනුවට මනෝසීල සහ හිඟුල් වැනි දෑ භාවිත කොට තිබේ. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සිංහල අක්ෂර සංවර්ධනය කෙරෙහි බලපෑ ද්‍රව්‍යමය සාධකවල ස්වභාවය හඳුනා ගැනීම යි. සිංහල භාෂාව ලියා දැක්වීමට භාවිත කළ බ්‍රාහ්මී අක්ෂරවල හැඩය වෙනස් ස්වභාවයකට පත්වීමෙහිලා ද්‍රව්‍යමය සාධකයන්ගේ බලපෑම කෙබඳු ද? යන්න මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කෙරේ. මෙරට අක්ෂරවල මූලික හැඩය වෙනස්වීම, හැඩතල සංවර්ධනය වීම, ආවේණික හැඩ මතුවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපෑ සාධකද්වයකි. එනම් අභෞතික වශයෙන් බලපෑ සංස්කෘතිය හා ආගම යනාදි සමාජ තත්ත්වය යි. අනෙක් කරුණ භෞතික වශයෙන් ලිවීම සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය හා උපකරණ යනාදිය යි. අක්ෂරයක වෙනස් වීම කෙරෙහි සමාජ සාධක බෙහෙවින් බලපාන බව බොහෝ පර්යේෂණවලින් අනාවරණය වී තිබේ. එහෙත් ලේඛන අමුද්‍රව්‍ය වැනි සාධකයක් අක්ෂරයක සංවර්ධනය කෙරෙහි බලපාන ස්වභාවය පිළිබඳ ප්‍රාමාණික අවධානයක් යොමු වී නැත. ක්‍රිස්තු පූර්ව 3වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂයෙන් 8වන සියවස පමණ දක්වා කාලය තුළ ලේඛන අමුද්‍රව්‍ය හේතුවෙන් අක්ෂරවල පැනනැගුණු වෙනස්කම් හඳුනාගන්නට තරම් සාධක නොවුණි. එහෙත් ක්‍රිස්තු වර්ෂ 8වන සියවසෙන් පසු ලිවීමේ කාර්යය සමාජ අවශ්‍යතාවක් වූ බැවින් විවිධ ලේඛන අමුද්‍රව්‍ය භාවිතයට පැමිණි අතර ඒවායෙහි ස්වභාවය අනුව අක්ෂරවල සියුම් වෙනස්කම් දක්නට ලැබුණි.

**මුඛ්‍ය පද:** සිංහල අක්ෂර, අක්ෂර නිර්මාණය, අක්ෂර සංවර්ධනය, අක්ෂර හැඩතල, ලේඛන අමුද්‍රව්‍ය

Article info

Article history:
Received 22th February 2023
Received in revised form 19th March 2023
Accepted 29th May 2023
Available online 30th June 2023

ISSN (E-Copy): ISSN 3051-5262
ISSN (Hard copy): ISSN 3051-5602
Doi: https://doi.org/10.4038/jmtr.v8i1.67
ORCID iD: https://orcid.org/0009-0008-5632-6647
*Corresponding author:
E-mail address: kithmip@kln.ac.lk (කිත්මි පෙරේරා)
CC BY-NC-SA © 2023, The Author(s)

## හැඳින්වීම

පෘථිවියෙහි සත්වයන්ගේ මූලය ප්‍රත්‍යක්ෂයෙන් හෝ අනුමානයෙන් හෝ වටහා ගැනීම දුෂ්කර ය. ලොව පහළ වී ඇති භාෂා ද මානවාරම්භය තරමට ම පැරණි හෙයින් භාෂාවක මූලය ද නිශ්චිත වශයෙන් දත නොහැක්කේ ය. **භාසියතෙ සන්තාන මජ්ඣාසයෝ එතායාති** යනාදි වශයෙන් නෛරුක්තික ව භාෂාව යනු තම තමන්ගේ සිත්වල පහළ වන අදහස් හා සිතිවිලි අනෙකාට හැඟවීම පිණිස භාවිත වාග් මාලාව යි. ලෝකයේ දැනට පහළ වී ඇති භාෂාවන්ගේ විවිධත්වයට හේතු වූයේ පසු කාලයේ ඇති වූ මානව වර්ගවාදය යි. ලොව හටගත් මූල භාෂා අතර බ්‍රාහ්මී භාෂා, දෛවී භාෂා, ආර්ය භාෂා හා මාගධී භාෂා වශයෙන් විවිධ නම් ලද්දේ වුව ද එක ම මූලයකින් හටගෙන පසු ව අනන්‍ය වාසගම් තහවුරු කොටගෙන තිබේ (ජයසේකර, 1970). ලේඛනය බිහිවූයේ භාෂණයෙන් සහශ්‍රවර්ෂයකට පමණ පසු ව යි (Healey,1990). ලිඛිත ව තොරතුරු ගබඩා කරන්නට වූ තැන් පටන් තනි මිනිසෙකු විෂයෙහි වූ හැකියාව, ඉන් ඔබ්බට ගමන් කොට දැනුම් පද්ධති නිර්මාණය කිරීමෙහිලා සමත් විය (Besserat, 1996).[1] එහෙයින් මිනිසා ලිවීමට ගත් උත්සාහයත් එමගින් ලේඛන ක්‍රම ප්‍රභවය වීමත් යනු සමාජ අවශ්‍යතාවන් පිළිබඳ දර්ශකයකි. ලේඛනයේ ප්‍රභවයට තුඩුදෙන ප්‍රබල ම ප්‍රකාශන ක්‍රමය හමුවන්නේ නියෝලිතික (Neolithic) යුගයේ භාවිත කළ මැටි සලාක ඔස්සේ ය (Besserat,1996).[2] එය ලේඛනයේ පූර්ව අවධිය ලෙස හැඳින්විය හැකි ය. ලේඛනයේ මූලික අවධිය එළඹෙන්නේ ඉන් අනතුරුව යි. සුමේරියන්වරු භාවිත කළ කූන්‍යාක්ෂරවල මුල් ස්වරූපය වන පික්ටොග්‍රැෆි (Pictography) ක්‍රමය මේ සඳහා නිදසුන් ය (Walker, 1987). ක්‍රිස්තු පූර්ව 3වන සහශ්‍රකය වන විට ලෝකයේ බිහි වී තිබූ ප්‍රධාන ශිෂ්ටාචාර හතක[3] විවිධ ලේඛන අමුද්‍රව්‍ය භාවිත කරමින් ස්වකීය ලේඛන ක්‍රමයක් නිර්මාණය කොටගෙන තිබුණි. ඊජිප්තු ලේඛන සාධක අනුව ඔවුන් ලිවීමට භාවිත කළ ලේඛන අමුද්‍රව්‍යන්ගේ ස්වභාවය විශ්ලේෂණාත්මක ව ගණනය කොට තිබේ (Adam Bulow, 2012). එක ම සභ්‍යත්වයක් තුළ පවා තමාට සුදුසු සහ ගැළපෙන පරිදි විවිධ ලේඛන අමුද්‍රව්‍ය වර්ග භාවිත කොට ඇති බව ඒ අනුව පැහැදිලි වේ. පහත දැක්වෙන්නේ ඇඩම් බුලොව් (2012) විසින් ඊජිප්තු ශිෂ්ටාචාරයේ භාවිතයට ගත් ලේඛන අමුද්‍රව්‍ය සහ භාවිතයේ ප්‍රමාණාත්මක සංඛ්‍යා දැක්වෙන ලැයිස්තුවකි.

**වගුව 1:** ඊජිප්තු ශිෂ්ටාචාරයේ භාවිත ලේඛන අමුද්‍රව්‍ය හා භාවිතය. මෙම ලැයිස්තුවේ පිළිවෙළ අනුව වැඩි ම භාවිතයක් ඇත්තේ පැපිරස් පත්‍ර මත ලිවීමේ ක්‍රමය යි. (Adam Bulow, 2012)

| Material | Documents | % of Documents | Literary Texts | % of Literary Texts |
|---|---|---|---|---|
| papyrus | 35,591 | 65% | 7,100 | 71% |
| ostraca | 15,195 | 28% | 339 | 3% |
| wood | 2,500 | 5% | 148 | 1% |
| parchment | 349 | 0.6% | 2,575 | 25% |
| graffiti | 234 | 0.4% | | |
| linen | 84 | | | |
| wax tablet | 73 | | | |
| stone | 67 | | 30 | |
| cloth (mummy | 30 | | | |


[1]*Writing also made it possible to store information, creating a pool of knowledge well beyond ilie ability of any single human to master yet, at ilie same time, available to all. Writing is regarded as the threshold of history because it ended the reliance upon oral tradition, with all the inaccuracies this entailed.* (බලන්න Besserat, 1996, 1පිටුව)

[2]ගණනය කිරීමේ උපකරණ ලෙස භාවිත කළ මැටි සලාක මගින් නිෂ්පාදන දත්ත හා වැඩබිම්වල දත්ත වාර්තාගත කිරීම සිදු විය. සලාකයේ හැඩය, ප්‍රමාණය හා සටහන් කොට තිබූ සංඥා මගින් නිශ්චිත සන්නිවේදනයක් නිකුත් කෙරුණේ ය. සෑම සලාකයක් ම භාණ්ඩයක එක් නිශ්චිත ප්‍රමාණයක් හා ගුණයක් සන්නිවේදනය කළේ ය. කේතුව සහ ගෝලය පිළිවෙළින් අප අද භාවිත කරන ලීටරය හා බුසල නිරූපණය කොට ඇත. සිලින්ඩරය සහ කවාකාර තැටිය සතුන් සංඛ්‍යාවත් යනාදි වශයෙන් සන්නිවේදනය කිරීමේ හැකියාව පැවතුණි.

[3]සුමේරියානුවන්ගේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරය (ක්‍රිස්තු පූර්ව 3100-ක්‍රිස්තු වර්ෂ 75), ඊළාම්හි මූල එලයිමට් ශිෂ්ටාචාරය(ක්‍රිස්තු පූර්ව 3000-2200), මූල ඉන්දුවරුන්ගේ ඉන්දු නිම්න ශිෂ්ටාචාරය (ක්‍රිස්තු පූර්ව 2200 දී පමණ), චීනයේ චීන ශිෂ්ටාචාරය (ක්‍රිස්තු පූර්ව 1300-අද දක්වා), ඊජිප්තුවේ ඊජිප්තු ශිෂ්ටාචාරය (ක්‍රිස්තු පූර්ව 3000-ක්‍රිස්තු වර්ෂ 400), ක්‍රීට් සහ ග්‍රීසියේ ක්‍රීටන් ශිෂ්ටාචාරය (ක්‍රිස්තු පූර්ව 2000-1200), ඇනටෝලියා හා සිරියාවේ හිටයිට් ශිෂ්ටාචාරය (ක්‍රිස්තු පූර්ව 1500-700) (Gelb,1952, p80)

| | |
|---|---|
| linen, etc.) | |
| leather, etc. | 25 |
| various semiprecious stones | 9 |
| limestone | 7 |
| bone | 7 |
| gold and silver | 6 |
| bronze | 6 |
| lead | 1 |
| iron | 1 |
| schist | 1 |
| reed | 1 |

පැපිරස් පත්‍ර මත ලිවීමේ ක්‍රමය ඊජිප්තුවරුන් අතර ජනප්‍රිය ව පැවති ක්‍රමයකි. එහෙත් සුමේරියානුවන් තම ලේඛනය සඳහා වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ මැටි පුවරු ය. මැටි පුවරුවක් මත කෝටුවකින් සටහන් තැබීම නිසා ම ඔවුන්ගේ ලේඛන ක්‍රමය සෙසු ලේඛන ක්‍රමයන්ගෙන් සුවිශේෂ වී තිබේ.



**රූපය 1.** ඌරුක්හි පික්ටොග්‍රැෆි ලේඛනය (W 21418.4) ඉරාකය. (Besserat,1996 p.72)

ආසියාවේ ප්‍රධාන ලේඛන ක්‍රමවේදයක් පැවති චීන ශිෂ්ටාචාරයේ ප්‍රධාන වශයෙන් උණ පතුරු සහ වෙනත් ලී වර්ග මත ලියා ඇති අතර ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මැටි, සෙල් සහ ලෝහ මත ලියූ ලේඛන හමු වේ. පසු කලෙක දී දකුණු ආසියාතිකයන් බහුතර පිරිසක් තම ලේඛන සංකේත ලෙස භාවිත කළ බ්‍රාහ්මී අක්ෂරවල මූලය ග්‍රීක හා ෆිනිෂියානු අක්ෂර හා සමාන බව විද්වතුන්ගේ මතය යි (Buhler, 1898; Dani, 1963). ඔවුන් ද පැපිරස් පත්‍රවල ලියා ඇති අතර සත්ව හම් හා ඉටි පුවරු මත ලිවීමේ ක්‍රමය ද අනුගමනය කොට තිබේ. භාරතය හා ලංකාව වැනි රටවල දැනට විද්‍යමාන ලේඛන බහුල ලෙස සටහන් ව ඇත්තේ සෙල් මත යි. එහෙත් ලෝක සාධකවලට සාපේක්ෂ ව දකුණු ආසියානු කලාපයෙන් සාධක හමු නොවුණ ද තත්කාලීන ව පැවති ශාකපත්‍ර මත ලිවීමේ ක්‍රමය  ඔවුන් ද භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි ය. මැටි මත ලිවීමේ සාධක ස්වල්ප ප්‍රමාණයක් ද දකුණු ආසියාවෙන් හමු ව තිබේ. ඒ අනුව සාමාන්‍ය ලේඛනය ශාකපත්‍ර හෝ මැටි මතත් විශේෂ ලේඛන සෙල් මතත් ලියන්නට ඇතැයි සිතීම සාධාරණ ය. කෙසේ වුව ද ලාංකේය ලේඛනයේ මූලික අවස්ථාව භාරතීය ලේඛන රටාවෙන් වෙනස් නොවේ. එය සහශ්‍රකයක් පමණ ගතවන තෙක් වෙනස් වූයේ ඉතා මන්දගාමී ව යි. එහෙත් ක්‍රිස්තු වර්ෂයෙන් 8වන සියවස පමණ වන විට ලේඛනයේත් අක්ෂර කලාවේත් සැලකිය යුතු වෙනස්කම් බොහෝ ප්‍රමාණයක් ඇති විය. අක්ෂරවල හැඩතල වෙනස් වී වටකුරු බවට පත් වීම ඉන් ප්‍රධාන වෙනස්කම යි. එමෙන් ම පසු වූ සහශ්‍රකයට වඩා ශීඝ්‍රයෙන් අක්ෂරවල හැඩ නූතන තත්ත්වයට පත්වන්නටත් ආවේණික ලක්ෂණ ඇති කරගන්නටත් සමත් වේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සමාජ තත්ත්වය වුවත් ලිඛිත සාධකවල වෙනස වටහාගැනීම පිණිස ද්‍රව්‍ය පිළිබඳ න්‍යායකරණය වැදගත් වේ. එහෙයින් මෙම පර්යේෂණයේ දී ලේඛනය සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය මගින් අක්ෂර විෂයෙහි සිදු කළ බලපෑම පිළිබඳ ව සලකා බැලීමට නියමිත ය.


## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා යොදාගෙන ඇත්තේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යි. මූල ග්‍රන්ථ අධ්‍යයනය සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇති අතර අවශ්‍ය විටෙක දී ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ද යොමු ව තිබේ. ක්‍රිස්තු පූර්ව

6/5 වන සියවස්වල සිට ක්‍රිස්තු වර්ෂ 15වන සියවස දක්වා ප්‍රධාන අවධි කිහිපයක් මුල් කොටගෙන ලියැවුණු අභිලේඛන මේ සඳහා යොදාගැනේ. නියැදිය තෝරා ගැනීමේ දී අක්ෂරවල සුපැහැදිලිතාව, කාලය හා අවකාශය සලකා බැලුණි. විශේෂයෙන් ම සමකාලීන ව ලේඛන අමුද්‍රව්‍ය කිහිපයක ලියූ සාධක හමු වූ යුග කෙරෙහි අවධානය යොමු කෙරුණේ ඒවායෙහි ලියා ඇති අක්ෂර සන්සන්දනාත්මක ව සලකා බැලිය යුතු බැවින් ය.


## සාකච්ඡාව හා පර්යේෂණ ප්‍රතිඵල

ලාංකේය අක්ෂරවල සංවර්ධනය සඳහා ලේඛන උපකරණවල බලපෑමක් වේ ද යන්න මින් පෙර විවිධ කතිකා ඇති වී තිබේ. පී.ඊ.ඊ ප්‍රනාන්දු, (ප්‍රනාන්දු, 2008) සෙනරත් පරණවිතාන (පරණවිතාන, 2002) හා ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි (පඤ්ඤාසාර හිමි, 2005) වැනි පුරාක්ෂර අධ්‍යයනය පිළිබඳ විද්වත්හු ලේඛන අමුද්‍රව්‍ය භාවිතයෙන්, ලිවීමේ ක්‍රමවේදයට බලපෑමක් වන්නේ දැයි යන්න අදහස් දක්වා ඇත. ශ්‍රී ලංකාවේ ලිවීමේ කලාව ආරම්භ වූයේ කෙදින දැයි අවිනිශ්චිත වුවත් ලේඛන කලාවක් පැවති බවට බහුල සාධක හමුවන ක්‍රිස්තු පූර්ව 3වන සියවසේ සිට ලාංකේය ලේඛකයාගේ ප්‍රධාන ලේඛන අමුද්‍රව්‍ය හා උපකරණය වූයේ ශෛලමය මතුපිටක් සහිත ක්ෂේත්‍රය හා ගල කඩතොලු කරන උපකරණය යි. අමතර වශයෙන් රන්පත්, තඹපත්, පාෂාණ, මනෝසීල හා තලපත් (පුස්කොළ) යන ලේඛන අමුද්‍රව්‍ය ද භාවිත කොට ඇත. එහෙත් ක්‍රිසුතු පූර්ව 3වන සියවසට පෙර ලාංකිකයා භාවිත කරන්නට ඇත්තේ කවර ලේඛන අමුද්‍රව්‍ය හා උපකරණ ද යන වගට සිතා බැලිය යුතු ය. මෑතක දී හමු වූ, ක්‍රිස්තු පූර්ව 3වන සියවසට පෙර ලියූ අක්ෂර බවට මත පළ කෙරෙන, බ්‍රාහ්මී අක්ෂර සහිත වළං කටු කැබැලි ඒ සඳහා සාක්ෂ්‍ය වේ. මේ අනුව පැහැදිලි වන්නේ, වළං කටු එසේත් නැතහොත් මැටි පුවරු ද ලිවීමේ අමුද්‍රව්‍ය ලෙස භාවිතයට ගත් බව යි (අඹන්වෙල, 2018). දැනට සිදු කොට ඇති කැණීම් කිහිපයකින් ක්‍රිස්තු පූර්ව 6-4 සියවස්වල මැටි පුවරු, බඳුන් නැතහොත් වෙනත් මැටි ක්ෂේත්‍රයක අක්ෂර ලියූ බවට සාධක හමු වී තිබේ. එනම්, අනුරාධපුර ඇතුළු නගරයේ, මහාපාලි දාන ශාලාව අසල කැණීම් සන්දර්භ 75ට අයත් බ්‍රාහ්මී පාඨ දැක්වෙන මැටි බඳුන් කොටස් පහක් (AMP 88(75)),



**රූපය 2.** (AMP 88(75)) -ත යා කු ටෙ (අඹන්වෙල, 2018)

අනුරාධපුර ඇතුළු නගරයේ, සල්ගහවත්ත කැණීම් සන්දර්භ 88ට අයත් බ්‍රාහ්මී පාඨ දැක්වෙන මැටි බඳුන් කැබලි දෙකක් (ASW 88(88)),



**රූපය 3.** (ASW 88(88)) බි ය අ නු ර (ධි) (අඹන්වෙල, 2018)

සහ ගල්ගමුව, අන්දරවැව පරිශ්‍රයෙන් සුසාන ගර්භයක වූ බිඳී ගිය මැටි බඳුනක බඳ කොටස් දෙකක තිබී බ්‍රාහ්මී අක්ෂර දෙකක් සොයාගෙන තිබේ. මෙම සොයාගැනීම්වලින් පැහැදිලි වන්නේ ශෛලමය ක්ෂේත්‍ර මත ලියූ යුගයට ප්‍රථම ලේඛනය අමුද්‍රව්‍ය ලෙස මැටි භාවිතය ප්‍රචලිත ව තිබූ බව යි. එහෙත් ඒවා පහසුවෙන් විනාශ වන අමුද්‍රව්‍ය බැවින් බොහෝ සාධක නෂ්ටප්‍රාය වන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. මෙකල තල කොළ හෝ ඊට සමාන අමුද්‍රව්‍යක් ලේඛනය සඳහා භාවිත කොට තිබුණ ද සාධක අවශේෂ වීමේ හැකියාවක් නැත. විජය රජුගේ අවධියේ පටන් විවිධ අවස්ථාවල ලියැවුණු ලේඛන පිළිබඳ ව මහා වංශයේ සඳහන් ය.[4] ඒ අනුව සෙල් හා

[4] මහාවංශ සාධක අනුව ක්‍රි.ව. 5වන සියවසේ දී මෙරට ලේඛන කලාවක් වූ බවට සාධක හමු වේ. මහාවංශයේ ඇති ගාථා පාඨ කිහිපයක ම ***ලේඛං*** යන වචනය යෙදී ඇත. එමගින් නිරූපණය කොට ඇත්තේ ලිපි හුවමාරුවක් පිළිබඳව යි.


*සීසං නාවාය ගන්ත්වාන - දූතා තෙ මධුරං පුරං*

මැටිවල ලිවීමට අමතර ව තවත් ලේඛන අමුද්‍රව්‍යයන් භාවිත කළායැයි සිතිය හැකි ය. ක්‍රිස්තු පූර්ව 6-4 වන සියවස්වලට අයත් මැටි බඳුන් අක්ෂරවල ස්වරූපය ඊට සියවස් තුනකට පමණ පසු ව ලියවුණ සෙල් අක්ෂරවලින් වෙනස් වන බවක් නොපෙනෙයි. බ්‍රාහ්මී අක්ෂර සියවස් ගණනාවක් නොවෙනස් ව පැවතීමත් මෙරට සමාජයේ ප්‍රබල ලේඛන අවශ්‍යතාවක් නොතිබීමත් මීට හේතු වන්නට ඇත.



**රූපය 4.** වෙස්සගිරිය සෙල් අක්ෂර (ක්‍රිස්තු පූර්ව 3-2 සියවස්) ක්ෂේත්‍ර අධ්‍යයනය, වෙස්සගිරිය 2022

මහින්දාගමනයෙන් පසු ව සෙල් මත ලිවීමේ සම්ප්‍රදාය දියුණු ව ආ අතර සෙසු ක්‍රමවේද යටපත් වූවායැයි ඉඳුරා පැවසිය නොහේ. එහෙත් අතිශය වටිනා කරුණු හා කලක් පැවතිය යුතු කරුණු සෙල් මත පිහිටුවා සමාජගත කරන්නට කටයුතු කළ බවක් පෙනෙයි. විශේෂයෙන් ම බුදු දහමේ ව්‍යාප්තික උපක්‍රමය වූ සෙල්ලිපි පිහිටුවීම ප්‍රධාන සාධකය බවට පත් විය. ක්‍රිස්තු පූර්ව 3වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 2වන සියවස දක්වා කාල වකවානුව තුළ භාවිත කළා යැයි සිතිය හැකි තවත් ලේඛන අමුද්‍රව්‍ය විශේෂයක් වන්නේ තලකොළය යි. ඊට හේතු වන්නේ මහින්දාගමනය සිදු වූ අවධියෙන් පසු ලේඛනගත කළායැයි සැලකෙන හෙළටුවා තලකොළ අමුද්‍රව්‍ය කොටගෙන ලියන්නට ඇතැයි සිතිය හැකි බැවිනි. එසේ නොවන්නට හෙළටුවා අදටත් විද්‍යාමාන විය යුතු ය. හෙළටුවා පෙළටුවා කිරීමෙන් පසු ගිනිබත් කළ බවට කෙරෙන ජනප්‍රවාද හා මතවාද අනුව ද හෙළටුවා තල කොළ මත ලියූ බව සිතීම යුක්ති යුක්ත ය. ලේඛන අමුද්‍රව්‍ය කිහිපයක් පිළිබඳ විවිධ මූලාශ්‍රය මගින් කියැවුණත් විද්‍යමාන ව පැවතියේ සෙල් අක්ෂර පමණක් බැවින් මෙම යුගයේ අක්ෂර කෙරෙහි ලේඛන අමුද්‍රව්‍යන්ගේ බලපෑම කෙරෙහි තීරණයකට පැමිණීම දුෂ්කර ය. එහෙත් මෙම යුගයේ හමුවන වල්ලිපුරම් රන්පතෙහි අක්ෂර සමඟ සෙල් අක්ෂර සසඳා බැලීමේ හැකියාව පවතී. ක්‍රිස්තු වර්ෂ 1-2 සියවස්වලට අයත් සෙල් අක්ෂර හා රන්පත් අක්ෂරවල ස්වභාවය විමසා බැලීම සඳහා නිදසුන් කිහිපයක් මතු දැක්වේ.



**රූපය 5.** වල්ලිපුරම් රන්පත - රන්පත් අක්ෂර (ක්‍රි.ව. 1-2 සියවස්) (ක්ෂේත්‍ර අධ්‍යයනය, කොළඹ ජාතික කෞතුකාගාරය, 2022)



**රූපය 6.** මහරත්මලේ ගිරි ලිපිය - සෙල් අක්ෂර (ක්‍රි.ව. 1-2 සියවස්) (ක්ෂේත්‍ර අධ්‍යයනය, අනුරාධපුරය, 2023)

---


*පණ්ණාකාරෙ ච ලෙඛං ච - තස්ස රඤ්ඤො අදසසයුං* (ම.ව. 7වන පරිː 51වන ගාථාව)
*අට්ඨාරසන්නං සෙණීනං - සහස්සං ච කුලානි සො*
*ලඛං දත්වාන පෙසෙසි - විජයස්ස ජිතාරිනො* (ම.ව. 7වන පරිː 57වන ගාථාව)
*අථා'මච්චෙහි මන්තෙත්වා - ලෙඛං තත්ථ විසජ්ජයී*
*ලෙඛං දත්වාන විජයො - න චිරෙන දිවංගතො* (ම.ව. 8වන පරිː 3වන ගාථාව)
*තස්ස පුත්තා තයො ආතුං - මද්දරාජස්ස ධීතුයා*
*දූතා සීහපුරං ගන්ත්වා - රඤ්ඤො ලෙඛං අදංසු තෙ* (ම.ව. 8වන පරිː 7වන ගාථාව) මීට අමතර ජී. බ්‍යුලර් බෞද්ධ සාහිත්‍යයෙන් සොයාගත හැකි පුරාණ ලේඛන සාධක පිළිබඳ ව අවධාරණය කරයි. ඒ අනුව ලාංකේය ත්‍රිපිටකයේ සඳහන් වන *ලිවීම*, *ලියන්නා* වැනි භාවිතයන් කිහිපයක් පෙන්වා දී ඇත. මෙම තොරතුරු මගින් ද ක්‍රි. පූ. 5වන හෝ 6වන හෝ සියවස්වලට අයත් පැරණි තොරතුරු නිරූපණය කෙරේ(Buhler,1962 p.19).

ඉහත සාධක අනුව පැවසිය හැකි වන්නේ සිංහල ප්‍රාකෘත යුගයේ අවසන් කාලවකවානුවේ දී ලේඛන අමුද්‍රව්‍යවල බලපෑම අක්ෂරවල හැඩයට නිශ්චිත වශයෙන් ම හේතු වූවේදැයි ඉඳුරා හඳුනාගත නොහැකි බව යි. එහෙත් සෙල් මත ලිවීමට වඩා රන්පතක අක්ෂර ලිවීම මදක් පහසු කාර්යයක් බැවින් රන්පත් අක්ෂරවල නියම හැඩය හා සුපැහැදිලිතාව ආරක්ෂා වී ඇති ආකාරය නම් නිරීක්ෂණය කළ හැකි ය.

මින් සියවස් කිහිපයකට අනතුරුව එනම් ක්‍රිස්තු වර්ෂ 8වන සියවසේ දී තඹ පත් ලේඛන පිළිබඳ ව ද සාධක හමු වේ. ඒ අනුව ක්‍රිස්තු වර්ෂ 8වන සියවසට අයත් තඹපත් (Paranavitana, 1928-1933, p 209) අක්ෂර හා සෙල් අක්ෂර (Paranavitana, 1934-1941, p 149) කිහිපයක් විමසීමෙන් ඒ බැව් තහවුරු කොට ගත හැකි ය.




**රූපය 7.** ඉඳිකටුසෑය තඹපත් අක්ෂර ක්‍රිස්තු වර්ෂ 8වන සියවස (ඡ්ර්බ්ඩසඡ්බ්ල 1928-1933)



**රූපය 8.** අම්බස්තල හා තම්මැන්නාව සෙල් අක්ෂර, ක්‍රිස්තු වර්ෂ 8වන සියවස. (ඡ්ර්බ්ඩසඑය්බ්ල 1934-1941)

ඉහත නිදර්ශන මගින් පෙනෙන්නේ තඹපත් අක්ෂරවල හැඩය ඒකාකාරී වූ අතර ම පැහැදිලි බව ද වර්ධනීය තත්ත්වයක පවතින බව යි. එනම් තඹ පත් මත ලිවීමේ පහසුව නිසාදෝ එම අක්ෂර ඉතා පැහැදිලි හැඩයක් ගෙන තිබුණත් සෙල් අක්ෂර සඳහා ඒකාකාරී හැඩයක් පවත්වාගෙන යාම දුෂ්කර වී ඇත. අක්ෂරයේ ප්‍රමාණය අතින් ද විවිධ වේ. මෙම අවධියේ ලියැවුණු සීගිරි ගීවල දක්නට ලැබෙන අක්ෂර කෙරෙහි ද අවධානය යොමු කිරීම වටී.




**රූපය 9.** සීගිරි කුරුටු ගී, ක්‍රිස්තු වර්ෂ 8-10 සියවස්. හද 75 (ඡ්ර්බ්ඩසඑය්බ්ල 1956)

ඒ අනුව ඉහත අක්ෂර වර්ගයන්ගේ සන්සන්දනාත්මක ඇගයීමක් පහත වගුවේ දැක්වේ.

**වගුව 2:** ක්‍රිස්තු වර්ෂ 8-9වන සියවස්වල අක්ෂර

| | ප | ළ | ය | න | ව | ස | ල | ද | ට | ර | ණ | ම | ග | ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සෙල් අක්ෂර** | | | | | | | | | | | | | | |
| **කුරුටු අක්ෂර** | | | | | | | | | | | | | | |
| **තඹපත් අක්ෂර** | | | | | | | | | | | | | | |



වගුවේ සඳහන් වන පරිදි අක්ෂර කිහිපයක හැරුණු විට සෙසු අක්ෂරවල හැඩය බොහෝ දුරට සමාන ස්වරූපයකින් දක්නට හැකි ය. සෙල් අක්ෂරවල හැඩයට වඩා කුරුටු ගී අක්ෂර හා තඹපත් අක්ෂරවල නිදහස් ලේඛන ශෛලියක් හා සුඛනම්‍ය ස්වරූපයක් හඳුනාගන්නට ලැබේ. ලේඛන අමුද්‍රව්‍යන්හි අක්ෂරවල විවිධතාව පැනනැගීම ආරම්භ වන්නේ මෙම යුගයේ දී බව පූර්වොක්ත නිදසුන් ඇසුරෙන් පැහැදිලි වේ.

මීළඟට එළඹෙන්නේ තලකොළ භාවිතය පිළිබඳ විද්‍යමාන සාක්ෂ්‍ය සහිත අවධිය යි. තලකොළ භාවිතය සඳහා ද දිගු ඉතිහාසයක් පවතින නමුදු පැරණි ම තලකොළ ලේඛන හමුවන්නේ ක්‍රිස්තු වර්ෂ 12වන සියවසේ දී ය. තල කොළවල ලිවීම වනාහි එක්තරා කලාවකි; අමුද්‍රව්‍ය සකසා ගැනීමේ සිට ලේඛනය දක්වා ම අපූර්ව ක්‍රියාවලියක් තිබේ. තල කොළයේ ලිවීම ශෛලමය මතුපිටක ලිවීම තරම් අපහසු නොවන බැවින් පුස්කොළයේ රචනා කරන්නට වූ තැන අක්ෂරවල විශේෂතා මතුවීම අපේක්ෂා කළ යුත්තකි. තල කොළයේ ලිවීම මගින් අක්ෂරවලට යම් බලපෑමක් වූවේ ද යන්න වියතුන්ගේ මත කිහිපයක් වේ.

මේ පිළිබඳ අදහස් දක්වන සෙනරත් පරණවිතාන බොහෝ දුරට අනුගමනය කොට ඇත්තේ ජෝන් බීම්ස්ගේ අදහස යි (Beames, 1872 p 65).[5] බීම්ස් පවසන්නේ අක්ෂරවල හැඩය වෙනස් වීම කෙරෙහි ලේඛන අමුද්‍රව්‍ය බලපාන බව යි. භාරතයේ භාවිත කළ හින්දි, පන්ජාබි, සින්ධි, ගුජරාඨි, මරාඨි, ඔරියා හා බෙංගාලි යන භාෂා පිළිබඳ කළ පර්යේෂණයක දී, විශේෂයෙන් ඔරියා ලේඛන ක්‍රමයේ හට ගත් රවුම් හැඩය සඳහා තල පත්‍රවල ලිවීම හේතු වූ බව ඔහුගේ අදහස යි. සිංහල අක්ෂර සම්බන්ධයෙන් සෙනරත් පරණවිතාන දැරුවේ ද ඊට සමාන මතයකි.[6] ක්‍රිස්තු වර්ෂයෙන් 6වන සියවසෙන් පසුව සිංහල අක්ෂරවල ඇති වූ රවුම් හැඩය ඔහු මේ සඳහා පාදක කොට ගත්තේ ය (පරණවිතාන, 2002).

පුස්කොළවල ලිවීම පිළිබඳ ස්වකීය මතය දක්වන පී.ඊ.ඊ ප්‍රනාන්දු පවසන්නේ, තල කොළයේ ඇති පහසුවෙන් ලිවිය හැකි ස්වභාවය, නැමෙන ගතිය, සිහින් බව, කල් තබාගත හැකි වීම, සැහැල්ලු බව ආදි ගති ලක්ෂණ නිසා තත් කාලයේ භාවිත සෙසු අමුද්‍රව්‍යවලට වඩා තල කොළය හොඳයැ'යි සම්මත වන්නට ඇති බව යි. පැරණි ම තල කොළ භාවිතය වනාහි යටත් පිරිසෙයින් ක්‍රිස්තු වර්ෂ 5වන සියවස වන විටත් පැවති ලේඛන අමුද්‍රව්‍යක් වන බව දක්වන හෙතෙම දැනට හමු වී ඇති පැරණි ම තල කොළ භාවිතයන් පිළිබඳ අදහස් දක්වයි.

> ශතවර්ෂ ගණනක් තිස්සේ ලක්දිව ලිවීම සඳහා භාවිත කළ සාමාන්‍ය අමුද්‍රව්‍ය නම් පුස් කොළ යි. එසේ වුවත් මේවා ලක්දිව භාවිතය පටන් ගත්තේ කවර අවධියක සිටදැ'යි ස්ථිර ව ම කිව නොහැකි ය. (ප්‍රනාන්දු, 2008 37පි.)

එහෙත් මෑතක දී යාපහුව ඉරහඳ නොපෙනෙනෙ ගුහා කැණීම්වලින් හමු වූ තල පත් කැබලි මගින් තහවුරු වන්නේ ලංකාවෙන් හමු වන පැරණි ම තලපත් අක්ෂර ක්‍රිස්තු ක්‍රිස්තු වර්ෂ 12වන සියවස තරම් ඉතිහාසයකට දිවෙන බව යි. මෙම තලපත් කැබලි බොහෝමයක් ඉතා කුඩා බැවින් ඒවායේ අන්තර්ගතය හඳුනාගැනීම තරමක් දුෂ්කර ය. එහෙත් ත්‍රිපිටකයෙහි සූත්‍ර පිටකයට අයත් සංයුක්ත නිකායෙහි සක්ක සංයුක්තයේ ධජග්ග සූත්‍රය,

---

[5] *In all probability in the case of Oriya, as in that of the other languages which I have mentioned above, the cause is to be found in the material used for writing. The Oriya and all the populations living on the coasts of the Bay of Bengal write on the Talapatra or leaf of the fan-Palm or Palmyra. The leaf of this tree is like a gigantic fan and is split up into strips about two inches in breadth or less, according to the size of the leaf, each strip being one naturally formed fold of the fan on these leaves, when dried and cut into proper lengths, they write with an iron style or Lekhani, having a very fine sharp point. Now it is evident that if the long, straight horizontal Matra, or top line of the Devanagari alphabet, were used the style in forming it would split the leaf, because, being a palm, it has a longitudinal fiber going from the stalk to the point. Moreover, the style being held in the right hand and the leaf in the left, the thumb of the left-hand serves as a fulcrum on which the style moves, and thus naturally imparts a circular form to the letters.* (Beames, 1872 p 65)

[6] *යුරෝපීයයන් විසින් කඩදාසි හඳුන්වාදෙනු ලබන්නට පෙර ශ්‍රී ලංකාවේ ලිවීම සඳහා භාවිත වුණු ද්‍රව්‍යය වූයේ පුස්කොළ ය. උල තියුණු පන්හිඳකින් ඊ මත අකුරු සූරන ලදි. තල්කොළවල තිරස් අතට දිවෙන තන්තු ඇති හෙයින් ඒවා මත සෘජු තිරස් රේඛා සීරීමේ දී ඒ කොළ පැලෙන්නට ඉඩ ඇත. එබඳු රේඛා පරිස්සමෙන් මග හැරීමට සිදු වූයේ ලිවීමේ පොදු මාධ්‍ය වශයෙන් මේ කාල පරිච්ඡේදයේ දී පුස්කොළ භාවිත වුණු නිසා විය හැකි ය. ලිවීමේ මාධ්‍ය වශයෙන් පුස්කොළ භාවිත කළ ඉන්දියාවේ සියලු කොටස්වල හා අසල්වැසි රටවල වක් වුණු හා රවුම් හැඩ අකුරු වර්ධනය වී ඇත.* (පරණවිතාන, 2002 62 පි.)

වෙපචිත්ති සූත්‍රය, හා සුභාසිත ජය සූත්‍රය යන සූත්‍රයන්ට අයත් තලපත් කැබලි කිහිපයක් පමණක් හඳුනාගැනීමට හැකි වී තිබේ. එම අක්ෂර යුගයේ සෙල් අක්ෂර තරම්වත් ක්‍රමානුකූල නොවූ බව දක්නට හැකි වේ. තලපත් හුදෙක් කාබනික ද්‍රව්‍ය වන බැවින් පහසුවෙන් දිරාපත් වීම සිදු වන නිසා තලපත් භාවිතය ඇරඹියේ කුමන කාල වකවානුවකදැ'යි නිගමනය කිරීම අපහසු ය. පවතින ඓතිහාසික සාක්ෂ්‍ය අනුව තලපත් භාවිතය ක්‍රිස්තු පූර්ව යුගවලට අයත් යැයි සිතිය හැකි බව අපි පෙර දී සඳහන් කළෙමු.


සෙනරත් පරණවිතාන දක්වන්නේ තල්පත් භාවිතය ඇරඹෙන්නට ඇත්තේ ක්‍රිස්තු වර්ෂ 8වන සියවසේ දී පමණ බව යි. එවැනි තීරණයකට පැමිණීම සඳහා හේතු වූ කාරණාව නම් බ්‍රාහ්මී අක්ෂර ක්ෂණික ව මෙන් රවුම් හැඩයෙන් යුක්ත වීම යි. එහෙත් මෙම යුගයේ අක්ෂරවල රවුම් හැඩයට හේතුව තලපත්වල ලිවීම පමණක් නොව දකුණු ඉන්දීය පල්ලවයන්ගේ ද බලපෑම බව පී.ඊ.ඊ ප්‍රනාන්දු දක්වන මතය යි (ප්‍රනාන්දු, 2008). එම මතයට හේතු වන්නේ අක්ෂරවල රවුම් හැඩය මතු වී ආයේ ක්‍රිස්තු වර්ෂ 8වන සියවසට ආදි යුගයේ සිට වීම යි. ලේඛන අමුද්‍රව්‍යයේ ස්වභාවය හඳුනාගැනීම සඳහා ක්‍රිස්තු වර්ෂ 11-12 සියවස්වල ලේඛන කිහිපයක් පහත දැක්වේ.



**රූපය 10.** තඹපත් අක්ෂර, පනාකඩුව තඹ සන්නස ක්‍රිස්තු වර්ෂ 11වන සියවස ඃෂ්ර්බ්ඩසඡ්බ්ීබා ටදා්නමපඉමර්ල 1965 ෑග' ඞදක ඕ චක 1*



**රූපය 11.** තලපත් අක්ෂර, ක්‍රිස්තු වර්ෂ 12වන සියවස ිසරසර්ඵය්බ් ්‍යසපසල 2016)








**රූපය 12.** සෙල් අක්ෂර හැටදාගේ වාහල්කඩ ලිපිය, ක්‍රිස්තු වර්ෂ 12වන සියවස (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2022, පොළොන්නරුව හැටදාගෙය වාහල්කඩ ලිපිය)

මෙම යුගයේ තඹපත්, සෙල් හා තලපත් අක්ෂරවල ස්වකීය ආවේණික හැඩතල ඉස්මතු කරයි. ලේඛන අමුද්‍රව්‍යයේ සුඛනම්‍යතාව හා හැසිරවීමේ පහසුව හේතුවෙන් තඹපත් අක්ෂරවල හැඩ රටා පැහැදිලි ව ඉස්මතු වී තිබෙනු දැක ගත හැකි ය. තලකොළයේ ලියූ අක්ෂර අපැහැදිලි ස්වභාවයක් ගෙන ඇත්තේ තලපත් ක්ෂේත්‍රය මත අක්ෂර ලිවීමේ දුෂ්කරතාව නිසා බැව් සිතිය හැකි වේ.

එහෙත් තලකොළ හා තඹපත් භාවිතය ප්‍රචලිත වීමත් සමඟ සෙල් අක්ෂරවල ස්වරූපය ඉක්මවාගිය සුපැහැදිලි හැඩයක් තලපත් හා තඹපත් අක්ෂර කෙරෙන් දිස් විය. එමෙන් ම නූතන අක්ෂරවල ස්වරූපය පළමු කොට දිස්වන්නේ සෙල් අක්ෂරවල නොවන අතර තඹ හා තලපත් අක්ෂරවල බව ද තහවුරු කොට ගත හැකි ය. ඒ සඳහා නිදසුන් කිහිපයක් මෙසේ ය.

**වගුව 3**: ලේඛන අමුද්‍රව්‍යයන්ට අනුව අක්ෂරවල විවිධත්වය

| සියවස 13-14 | අ | ඉ | එ | ඔ | බ | හ | ඩ | ව |
|---|---|---|---|---|---|---|---|---|
| සෙල් |  |  |  |  |  |  |  |  |
| තඹ |  |  |  |  | | | | |
| තල | | | | |  |  |  |  |

ඉහත තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවෙන් දැනට හමු වී ඇති සාධක අතර, මැටි, ශිලා, රන්පත්, තඹපත් හා තලකොළ (පුස්කොළ) ලේඛන කාර්යය සඳහා භාවිත කොට ඇති බවට තහවුරු වී තිබේ. මීට අමතර ව ලිවීම සඳහා ලී පතුරු හෝ ඊට සමාන යමක්, ගල් කටුව, තෙල්ල (පාලි :තුලිකා) සමඟ තීන්ත වෙනුවට මනෝසීල සහ හිඟුල් භාවිත කළ බවට ද සාධක හමු වී ඇත. මේ සියලු අමුද්‍රව්‍ය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් යම් නිගමනයකට පැමිණිය හැකි ය. එනම් සරල ව හැසිරවිය හැකි අමුද්‍රව්‍ය මත ලිවීම පහසු ය. ලිවීමට ගතවන කාලය හා පහසුව මත අක්ෂර ලිවීමේ දී යම් බලපෑමක් ඇති වීම ඉච්චානුගත ය. එනම් ගල් කටුවකින් මහ කලු ගලක අක්ෂරයක් මතුකිරීමට වඩා මැටි පුවරුවක හෝ මැටි බඳුනක ලිවීම පහසු ය. එකී ප්‍රායෝගික තත්ත්වය මත අක්ෂරවල ස්වරූපයට යම් බලපෑමක් ඇති කළ හැකි බැව් දක්නට හැකි ය. එසේ සිදුවන්නේ ලේඛන කාර්යය බහුල ව පවතින අවධියක යි. ක්‍රිස්තු පූර්ව යුගයේ පටන් විවිධ ලේඛන අමුද්‍රව්‍ය භාවිත කළ ද ලේඛන අමුද්‍රව්‍යවල ලියූ අක්ෂර අතර පැහැදිලි වෙනස්කම් දක්නට හැකි වන්නේ ක්‍රිස්තු වර්ෂයෙන් 8වන සියවසේ දී ය. එකල සිදු වූ සමාජ පරිවර්තනය ලේඛනය විෂයෙහි ද ඍජු ව බලපෑම ඊට හේතුව යි. ඒ අනුව ක්‍රිස්තු වර්ෂ 8වන සියවසේ සිට 12වන සියවස දක්වා කාලය තුළ ඇති වූ,

I. ජාත්‍යන්තර හා ජාතික මට්ටමෙන් සමාජයේ ඇති වන සුවිශේෂ වෙනස්කම් ලාංකේය සමාජයට බලපෑම (ලෝක වෙළඳ ආර්ථිකය)
II. ලාංකේය දේශපාලන ප්‍රතිපත්තියේ ස්වභාවය
III. ආගමික හා අධ්‍යාපනික පරිවර්තනයෙන් පැනනැගුණු ශාස්ත්‍ර පුනර්ජීවනය

වැනි සාධක මත මෙරට සමාජීය පරිවර්තනයක් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස පැනනැගුණු විභවතාවක් වූයේ මෙරට භාෂාවේ සිදු වූ වෙනස් වීම යි. විශේෂයෙන් ම,

I. ක්‍රිස්තු වර්ෂයෙන් 8-10වන සියවස් වන විට අප භාවිත කළ වාග් මාලාව අතිශය සංකීර්ණ වීම
II. ක්‍රිස්තු වර්ෂයෙන් 12වන සියවස වන විට තත්සම වදන් භාවිත කිරීමේ සම්ප්‍රදායේ කූටප්‍රාප්තිය සටහන් වීම
III. ඒ අනුව සිංහල භාෂාවට එක් වූ නව ශබ්දවලට අනුරූප වන පරිදි නව අක්ෂර බිහි වීම
IV. අක්ෂරවල හැඩතල සංවර්ධනය ශීඝ්‍ර වීම හා ක්‍රිස්තු වර්ෂයෙන් 12වන සියවස වන විට අක්ෂර බහුතරය ස්ථාවරත්වයට පත් වීම

වනාහි මෙරට අක්ෂර නිර්මාණයේ වටිනා සන්ධිස්ථාන සේ සැලකිය හැකි ය. මෙම සංසිද්ධි හේතු කොට ගෙන සහශ්‍රවර්ෂයකටත් අධික කාලයක් සිංහල අක්ෂරවල පැවති බ්‍රාහ්මී ස්වභාවය වෙනස් ව ගිය අතර දේශීය අනන්‍යතාවක් සිහිත හැඩතල නිර්මාණය වීම ද සිදු විය. අනන්‍යතා හටගන්නේ ම සංකීර්ණත්වයේ ප්‍රතිඵලයක් ලෙස යි. ඒ අනුව සිංහල අක්ෂරවල ද ස්වීය අවශ්‍යතාවන්ට අනුකූල නූතන තත්ත්වයේ හැඩය ඉස්මතු වන්නේ මෙම අවධියේ දී ම ය. එහි ද්‍රව්‍යමය සාධක අපට සපයාගත හැකි වන්නේ ලේඛන අමුද්‍රව්‍යන්ගේ විශේෂතාව අනුව යි.

## සමාලෝචනය

ශ්‍රී ලංකාවේ පුරාණ ලේඛනය සඳහා ප්‍රධාන වශයෙන් භාවිත කොට ඇති අමුද්‍රව්‍ය කිහිපයකි. එනම් මැටි, සෙල්, තඹපත් හා තලපත් ය. ලේඛන ක්ෂේත්‍රයට ගැළපෙන පරිදි අක්ෂර ලිවීමට භාවිත කළ උපකරණය ද වෙනස් කොට ගැනුණි. ඒ අනුව ක්‍රිස්තු පූර්ව 5/4වන සියවස්වල මැටි ක්ෂේත්‍ර මත ලිවීම පිළිබඳ සාධක හමුවන අතර

සෙල් මත ලිවීම ප්‍රචලිත වන්නේ ක්‍රිස්තු පූර්ව 3වන සියවසෙන් පසු ව ය. මේ යුගයේ සෙල් හා මැටි ක්ෂේත්‍රවල අක්ෂර සාම්‍යතාවක් දරයි. ඉන් සියවස් තුනකට පමණ පසු රන්පත්වල ලිවීම පිළිබඳ සාධක හමුවන අතර ක්‍රිස්තු වර්ෂ 2/3වන සියවස් වන විට සෙල්, රන්පත් මෙන් ම තලපත් ද භාවිත කළා යැයි පැවසෙතත් තලපත් අක්ෂර සඳහා සාධක අවිද්‍යමාන ය. සෙල් හා රන්පත් අක්ෂර අතර සැලකිය යුතු වෙනසක් මෙම යුගයේ හඳුනාගත නොහැකි වුවත් රන්පත් අක්ෂර මනා හැඩයෙන් හා සුපැහැදිලි බව අතින් ඉදිරියෙන් තැබිය හැකි ය. අනතුරුව ක්‍රිස්තු වර්ෂ 8වන සියවස වන විට ද ඉහත කී ලේඛන අමුද්‍රව්‍යත්‍රය ම භාවිත කළ බැව් සඳහන් වෙතත් විද්‍යමාන ව පැනෙන්නේ රන්පත් හා සෙල් අක්ෂර යි. කැටපත් පවුරෙහි සටහන් කළ කුරුටු ලිපි ද මෙම යුගයට අයත් වන අතර තඹපත්වල අක්ෂර ලිවීම ඇරඹී එන්නේ ද මෙම කාලයේ දී ය. මෙම යුගයෙන් ද හඳුනාගත හැකි වන්නේ සෙල් අක්ෂරවලට සාපේක්ෂ ව තඹ හා කැටබිත මත ලියූ අක්ෂරවල සුපැහැදිලිතාව හා සියුම් ලක්ෂණ අතින් සිදු ව ඇති පරිණත ස්වරූපය යි. ලේඛන අමුද්‍රව්‍ය අනුව අක්ෂරවල විවිධත්වය මැනවින් අධ්‍යයනය කළ හැකි වන්නේ ක්‍රිස්තු වර්ෂයෙන් 12වන සියවසට පසු ව ලියැවුණු ලේඛනවල යි. ක්‍රිස්තු වර්ෂ 12වන සියවස වන විට ප්‍රචලිත ව පැවතියේ සෙල්, තඹ හා තලපත් මත ලිවීමේ ක්‍රමත්‍රය යි. ඒ අනුව ක්‍රිස්තු වර්ෂ 13-14වන සියවස්වල අක්ෂර සන්සන්දනයෙන් තහවුරු වූයේ නූතන අක්ෂරවල හැඩය හා ස්වභාවය පළමු ව පළ කළේ සෙල්මත ලියූ අක්ෂරවලට වඩා සුඛනම්‍ය ක්ෂේත්‍ර වූ තඹ හා තල්පත් මත ලියූ අක්ෂරවල බව යි. එබැවින් නූතන සිංහල අක්ෂර නිර්මාණය වීමේ දී සමාජීය සාධක සේ ම පැරණි ලේඛන අමුද්‍රව්‍යවල ද යම් බලපෑමක් දක්නට ලැබෙන බව තහවුරු කළ හැකි වේ. එය වඩාත් හොඳින් නිරීක්ෂණය වන්නේ ලේඛනය බහුල ව සිදු වූ අවස්ථාවල දී බව ද කිව යුතු ය.

## මූලාශ්‍ර නාමාවලිය


Beames, J. (1872). *Comparative Grammer of the Modern Aryen Languages of India.* London: Trubner & Co. 8 and 60 Paternoster Row.

අඹන්වෙල, එච්. (2018 දෙසැම්බර් 24) *බ්‍රාහ්මී අක්ෂර මාලාවේ පෞරාණිකත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් අනාවරණය වී ඇති සාධක පිළිබඳ අවලෝකනයක්.* ශ්‍රී ලංකා පුරාවිද්‍යාව- Sri Lanka Archaeology. https://sinhala.archaeology.lk/%E0%B6%B6%E2%80%8D%E0%B7%8A%E2%80%8D%E0%B6%BB%E0%B7%8F%E0%B7%84%E0%B7%8A%E0%B6%B8%E0%B7%93-%E0%B6%85%E0%B6%9A%E0%B7%8A%E2%80%8D%E0%B7%82%E0%B6%BB-%E0%B6%B8%E0%B7%8F%E0%B6%BD%E0%B7%8F%E0%B7%80%E0%B7%9A/

අමරවංශ හිමි, කොත්මලේ. (2014). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

කුලතිලක, ඒ. ඇම්. (1961). *ඇතැම් සිංහල මුල් හා සබඳ.* කොළඹ: සීමාසහිත ස්වභාෂා ප්‍රකාශකයෝ.

ගුණසේකර, බන්දුසේන. (2009). *සිංහල හෝඩිය දැනගන් ඉඳුරා.* කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

ධම්මකුසල හිමි, අම්බලන්ගොඩ. (1949). *සිංහල අකුරු* අම්බලන්ගොඩ: ඒ. ඇම්. ප්‍රැන්සිස් ද සිල්වා ප්‍රකාශකයෝ.

ජයසේකර, ආනන්ද සහ ජයසේකර චිත්‍රා. (1970, 2015) *තුලනාත්මක වාග්විද්‍යාව.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ. (2005) *සිංහල අක්ෂර රූප විකාශය හා භාරතීය ආභාසය.* නුගේගොඩ: කර්තෘ ප්‍රකාශන.

පරණවිතාන, ඇස්. (2009). ගම්ලත්. සුචරිත (පරි). *සීගිරි කුරුටු ගී.* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පරණවිතාන. ඇස්. (සංස්.). (2002). ඩබ්ලිව්. බී මාක්ස් ප්‍රනාන්දු. (පරි.). *ශිලාලේඛන සංග්‍රහය* IV වෙළුම. කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පරණවිතාන, ඇස්. සහ පීටර් සිල්වා. ඇම්. එච්. (2009). *සීගිරි ගී වියරණ* 1වැනි කාණ්ඩය. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ප්‍රනාන්දු, පී.ඊ.ඊ. (2008). තිස්ස කාරියවසම්. (පරි). *සිංහල අක්ෂර මාලාවේ සම්භවය හා විකාසය.* බත්තරමුල්ල: ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය.

බලගල්ල, විමල් ජී. (2016). *සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, විමල්. ජී. (2014). *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

බිනරගම, දයානන්ද. (2008). *ශ්‍රී ලංකාවේ ප්‍රාථමික චිත්‍ර කලාව සහ ප්‍රාථමික ලේඛන කලාව.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

බෙල්, එච්. සී. පී. (2005). කොත්මලේ කේ. බී. ඒ. එඩ්මන්. (පරි). *කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ශ්‍රී සුමංගල නායක හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත. (සංස්). (2006). *මහාවංසය.* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මුදියන්සේ, නන්දසේන. (1965). *සිංහල අකුරුවල ඉතිහාසය.* කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලය.

රණවැල්ල, සිරිමල්. (2004). *සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය.* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ලංකාගේ, ජයසිරි. (1996). *සිංහල වර්ණමාලාවේ විකාසය.* වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

සිරිරතන හිමි, පී. (2016). යාපහුව ඉරහඳ නොපෙනෙන ගුහා කැණීමෙන් හමු වූ ශ්‍රී ලංකාවේ පැරණිතම තල්පත් අක්ෂර. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (සංස්.). *Ancient Ceylone* No 25:169-172. කොළඹ:පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සිල්වා, දොන් මර්තීනු. (2000). කරුණාරත්න සද්ධාමංගල.(පරි). *ශිලා ලේඛන සංග්‍රහය I.* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

හැලෝගම. විමලසේන. (2003). *ශ්‍රී ලාංකික අක්ෂර මාලාවෙහි ආරම්භය.* වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

Beames, J. (1872). *Comparative Grammer of the Modern Aryen Languages of India.* London: Trubner & Co. 8 and 60 Paternoster Row.

Besserat, D. (1996). *How Writing Came About.* United States of America: The University of Texas Press.

Buhler. G. (1898). *Indian Paleography*. Indian studies past and present 3 Shambhunath pundit street Calcutta.

Burgess, J. (Ed.). (1892). *Epigraphia Indica* (vol. I) India: The Superintendent of government printing.

Bulow, A. (2012) *Writing Materials in the ancient world*. London: The Oxford Hand Book online edition.

Dias. M. (1991). *Epigraphical Notes***.** Colombo: Department of Archeology Pidurangala.

Fernando. P.E.E. (1949). *University of Ceylon Review* (vol. VII) No 3. Sri Lanka: University of Ceylon.

Gelb, I. J. (1952). *A Study of Writing*. London: The University Press of Chicago.

Gunasekara. B. (1999). *The Evolution of the Sinhalese Script***.** Colombo: S Godage and Brother's.

Hasan Dani. A. (1997). *Indian Paleography*. Oxford clarendon press. India.

Healey, F. J. (1990). *The Early Alphabet*. Berkeley: British Museum Publication.

Jayarajan.M.Paul. (1976). *History of the Evolution of the Sinhala Alphabet***.** Colombo: Apothecaries Company limited.

Kathryn, E Piquette and Ruth D Whitehouse. (2013). *Writing Material Practice*. London: Ubiquity Press.

Paranavitana, S. (Ed.). (1970). *Inscriptions of Ceylon* (vol. I) Ceylon: Department of Archaeology.

Paranavitana, S. (Ed.). (1928-1933). *Epigraphia Zeylanica* (vol. III) (p. 209). London: Oxford University Press.

Paranavithana, S. (1934–1941). *Epigraphia Zeylanica* (vol. IV) (p. 149). London: Oxford University Press.

Paranavitana, S. (1956). *Sigiri Graffiti* London: Oxford University Press.

Paranavitana, S. & Godakumbura. C.E. (Ed.). (1965). *Epigraphia Zeylanica* (vol. V) Ceylon: Archaeological Department.

Ranawella. G. S. (Ed.). (2004). *Inscriptions of Ceylon***.** (vol. V) Sri Lanka: The Department of Archaeology.

Ranawella, S. (Ed.). (2001). *Inscriptions of Ceylon.* (vol. I) Sri Lanka: The Department of Archaeology.

Ranawella, S. (Ed.). (2014). *Inscriptions of Ceylon* (vol. VII) Sri Lanka: The Department of archaeology.

Ranawella. S. (2005). *Sinhala Inscription in the Colombo National Museum* Colombo: Department of National Museum

Rohanadeera, M. (Ed.). (2007). *Inscriptions of Ceylon* (vol. VIII). Sri Lanka: The Department of Archaeology.

Walker, C.B.F. (1987). *Reading The Past - Cuneiform*. London: British Museum Press.

Wikramasinghe, D.M.D.Z. (Ed.). (1912). *Epigraphia Zeylanica* (vol. I) Ceylon: Oxford University Press.

Wikramasinghe, D.M.D.Z. (Ed.). (1928). *Epigraphia Zeylanica* (vol. II) Ceylon: Oxford University press.